# ගැබ්ගෙල පිළිකාව



ජාතික පිළිකා මර්දන වැඩසටහන

සෞඛ්‍ය අමාත්‍යාංශය

# ගෝලීය තත්ත්වය

**නව රෝගීන් වාර්තාවීම**

- ලොව පුරා කාන්තාවන්ගේ පිළිකා අතරින් 4 වන තැන ගනී
- ලොව පුරා රෝගීන් 662,301 (2022)
- ඉන් 85% අඩු සංවර්ධිත රටවල ය

**මරණ**

- පිළිකා ආශ්‍රිත කාන්තාවන්ගේ මරණ අතරින් 9 වන ප්‍රමුඛතම හේතුවකි
- 2022 දී ගැබ්ගෙල පිළිකා මරණ 348,874 කි
- ඉන් 87%ක් අඩු සංවර්ධිත රටවල ය

# ශ්‍රී ලංකාවේ ගැබ්ගෙල පිළිකා නව රෝගීන් වාර්තා වීම 2005 - 2021

2021 වර්ෂයේ දත්ත අනුව ගැබ්ගෙල පිළිකාව ශ්‍රී ලාංකික කාන්තාවන් අතර 5 වෙනියට වැඩිම පිළිකාව වේ.

## ශ්‍රී ලංකාවේ ගැබ්ගෙල පිළිකා පිළිබඳ වයස ප්‍රමාණිකෘත අනුපාත, 2005-2021







Figure 40: Age Standardized Incidence Rates of Cervical cancer in Sri Lanka, 2005-2021

# ශ්‍රී ලංකාවේ ගැබ්ගෙල පිළිකා නව රෝගීන් වාර්තා වීම 2021



# ගර්භාෂයේ හා ගැබ් ගෙලෙහි ව්‍යුහය



# ගැබ්ගෙල පිළිකා

හියුමන් පැපිලෝමා වෛරස ආසාදනය නිසා ඇතිවේ

HPV ලිංගිකව සම්ප්‍රේෂණය වේ

- ✓ සාමාන්‍යයෙන් රෝග ලක්ෂණ නොමැත
- ✓ රෝග ලක්ෂණ ඇති වීමට පෙර HPV ආසාදනය සඳහා ප්‍රතිකාර නොමැත
- ✓ බොහෝ විට ප්‍රතිශක්තිකරණ පද්ධතිය මගින් වෛරස් ඉවත් කිරීම සිදුවේ; සමහරක් දිගටම පවතියි.


# ගැබ් ගෙල පිළිකා

හියුමන් පැපිලෝමා වෛරස ආසාදනය නිසා ඇතිවේ

ගැබ්ගෙල පිළිකා වැළඳුණු අයගෙන් 99% ට වැඩි ප්‍රමාණයකට HPV පවතියි.

- ❖ පිළිකා හා සම්බන්ධ ඉහළ අවදානම් HPV වර්ග (16, 18).
- ❖ අඩු අවදානම් HPV වර්ග මගින් ලිංගික ඉන්නන් (VIRAL WARTS) සෑදේ
- ❖ සියළුම වර්ග මගින් අසාමාන්‍ය පැප් පරීක්ෂණ ප්‍රතිඵල ලැබේ

# Natural History of Cervical Cancer




# Continuum of Care

PREVENTION

Early detection
Screening

Diagnosis/
Treatment

Palliative Care

# අවදානම් සාධක

**ගැබ්ගෙල පිළිකා සඳහා මූලික ම හේතුව HPV ආසාදනයයි**

- අඩු වයසේදී ලිංගික ක්‍රියාකාරකම් වල නියැලීම
- ලිංගික සහකරුවන් වැඩි ගණනක් සිටීම
- සහකරුගේ අධි  අවදානම් ලිංගික ක්‍රියාකාරකම්
- දුර්වල සමාජ-ආර්ථික තත්ත්වය
- දුර්වල සනීපාරක්ෂාව
- ප්‍රතිශක්තිකරණය  - හීන වීම (ප්‍රාථමික/නතු කර ගත්)

# වෛරසය ආසාධනය වූ පසු, එය නොනැසී පවත්වා ගැනීමට බලපාන සාධක

- ගර්භණීභාවයන් වැඩි ගණනක් තිබීම
- දුම්පානය
- ප්‍රතිශක්තිකරණය හීන වීම
- දුර්වල සමාජ-ආර්ථික තත්ත්වය
- දුර්වල පෝෂණ තත්ත්වය
- උපත් පාලන පෙති දීර්ඝ කාලයක් භාවිතා කිරීම

# රෝග ලක්ෂණ

පූර්ව පිළිකා තත්වයන් - සාමාන්‍යයෙන් රෝග ලක්ෂණ නොපෙන්වයි

පූර්ව පිළිකාව, ආක්‍රමණශීලී පිළිකාවක් බවට පත් වූ විට රෝග ලක්ෂණ ආරම්භ වේ

# සුලබ රෝග ලක්ෂණ

- ✓ ඔසප්චක්‍ර දෙකක් අතරදී ඇතිවන රුධිර වහනය
- ✓ ආර්තවහරණයෙන් පසු ඇතිවන රුධිර වහනය
- ✓ ලිංගික සංසර්ගයකින් පසු ඇතිවන රුධිර වහනය
- ✓ යෝනි මාර්ගයෙන් අසාමාන්‍ය රුධිර වහනයක් සිදුවීම
- ✓ යෝනි මාර්ගයෙන් ලේ/ සැරව වහනය වීම

# පැතිරුණු ගැබ්ගෙල පිළිකාවක රෝග ලක්ෂණ

- රක්තහීනතාවය (අසාමාන්‍ය යෝනි රුධිර වහනය හේතුවෙන්)
- ශ්‍රෝණිය, කකුල හෝ කොන්දේ වේදනාව
- මුත්‍රා මාර්ග ආශ්‍රිත ගැටළු හෝ වකුගඩු අකර්මණ්‍ය වීම
- යෝනි මාර්ගයට මුත්‍රා හෝ මළපහ පිටවීම

(යෝනි මාර්ගය සහ මුත්‍රාශය හෝ ගුද මාර්ගය අතර ෆිස්ටුලා සෑදීම නිසා)

- බර අඩුවීම
- ආහාර රුචිය නැති වීම

# ගැබ් ගෙල පිළිකාව පාලනය කිරීමේ උපාය මාර්ග

- වැළැක්වීම
- පරීක්ෂණ මගින් රෝග ලක්ෂණ පහළ වීමට පෙර හඳුනා ගැනීම (screening)
- රෝග ලක්ෂණ සහිත රෝගීන්ගේ මුල් අවධියේ දී රෝගය හඳුනා ගැනීම
- ප්‍රතිකාර ලබා දීම

# ගැබ් ගෙල පිළිකාව පාලනය කිරීමේ උපාය මාර්ග

වැළැක්වීම

- HPV වලට එරෙහිව එන්නත් කිරීම
- ආරක්ෂිත ලිංගික හැසිරීම්
- ලාබාල වියේදී ලිංගික ඇසුරෙන් වැළකීම
- දුම්පානයෙන් වැළකීම
- සෞඛ්‍ය සම්පන්න ජීවන රටාව

# HPV එන්නත්කරණය

- වැළැක්වීම සඳහා ඉතා ඵලදායී ක්‍රමයක් වේ
  - ✓ HPV 16, 18 මගින් පූර්ව පිළිකා තත්ත්ව ඇති කරයි.
  - ✓ HPV 6, 11 මගින් ඇතිවන ලිංගික ඉන්නන්
- ශ්‍රී ලංකාවේ අවුරුදු 10-11 අතර ගැහැණු ළමුන් සඳහා පාසල් තුළ ප්‍රතිශක්තිකරණ වැඩසටහනක් ක්‍රියාත්මක වේ
- මාත්‍රා 2ක්, මාස 0, 6 - 12 ලෙස ලබා දේ

# ශ්‍රී ලංකාවේ ගැබ්ගෙල පිළිකා කලින් හඳුනා ගැනීමේ පරීක්ෂණ (screening)

- සුවනාරි සායන වැඩසටහන (WWC)
  - පැප් ස්මියර් පරීක්ෂාව
- අවුරුදු 35 සහ 45 කාන්තාවන් සඳහා පරීක්ෂණ සහ පසු විපරම් සිදු කරයි
- සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලවල සුවනාරි සායන 1000ක් පමණ පැවැත්වේ
- පවුල් සෞඛ්‍ය කාර්යංශය මගින් සම්බන්ධීකරණය කරයි
- HPV DNA පරීක්ෂාව: ශ්‍රී ලංකාව තුළ ව්‍යාප්ත වෙමින් පවතී

# HPV DNA පරීක්ෂණය

- වඩාත් නිවැරදි පරීක්ෂණයකි
- මෑතකදී හඳුන්වා දුන් අතර දැනට ශ්‍රී ලංකාව තුළ ව්‍යාප්ත වෙමින් පවතී
- HPV DNA ඍණාත්මක නම් (negative), අවදානම් සාධක සලකා බලා රෝගියා වසර 5කින් නැවත පසු විපරම් සඳහා යොමු කළ හැකි ය.
- HPV DNA ධනාත්මක නම් (positive) පැප් ස්මියර් පරීක්ෂණය කිරීමට අවශ්‍ය වේ.
- ධනාත්මක HPV DNA (positive) සහ අසාමාන්‍ය පැප් පරීක්ෂණය සඳහා කොල්පොස්කොපි පරීක්ෂාව අවශ්‍ය වේ

# ප්‍රාථමික සත්කාර කාර්ය මණ්ඩලයේ වගකීම

1. ආවරණය: 100% ළඟා වීමට උත්සාහ ගැනීම
2. සෑම සේවාදායකයෙකුටම නියමිත වේලාවට වාර්තාව ලබා දීමට කටයුතු කිරීම
3. අවශ්‍ය නම් යොමු කිරීම සිදු කළ යුතු අතර වාර්තා පවත්වාගෙන යා යුතුය

(උදා: කොල්පොස්කොපි)


4. සෑම කෙනෙකුටම අවශ්‍ය ප්‍රතිකාර ලැබෙන බවට වග බලා ගැනීම සහ වාර්තා යාවත්කාලීන කිරීම

# ප්‍රාථමික සත්කාර කාර්ය මණ්ඩලයේ වගකීම

**පසු විපරම් කිරීම ඉතා වැදගත් වේ.**

සුවනාරි සායනයට (WWC) පැමිණෙන ආකාරය, දිනය සහ වේලාව දැන ගැනීමට ඕනෑම කාන්තාවකට ප්‍රදේශයේ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනිය සම්බන්ධ කර ගත හැකි ය.

# කොල්පොස්කොපි




- පැප් ස්මියර් වාර්තාව මත පදනම්ව සමහර සේවාලාභීන් කොල්පොස්කොපි පරීක්ෂණය සඳහා යොමු කළ යුතුය
- ශ්‍රී ලංකාවේ කොල්පොස්කොපි පරීක්ෂාව සිදු කරනු ලබන්නේ නාරිවේද විශේෂඥ වෛද්‍යවරුන් විසිනි
- කොල්පොස්කොපි පරීක්ෂාව සිදු කරනු ලබන්නේ,
  - ගැබ්ගෙල තුවාල පිළිබඳ වැඩිදුර විමර්ශනය කිරීමට
  - ගැබ්ගෙලෙහි සමහර සුළු තත්වයන් සඳහා ප්‍රතිකාර ක්‍රමයක් ලෙස

# ශ්‍රී ලංකාවේ කොල්පස්කොපි මධ්‍යස්ථාන (2024)





# ගැබ්ගෙල පිළිකා තුරන් කිරීමේ උපාය මාර්ගය


ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් ගැබ්ගෙල පිළිකා තුරන් කිරීම වේගවත් කිරීම සඳහා ගෝලීය උපාය මාර්ගයක් දියත් කර ඇත

# 2030 වන විට සාක්ෂාත් කර ගත යුතු ගැබ්ගෙල පිළිකා තුරන් කිරීමේ අන්තර්කාලීන ඉලක්ක

- වයස අවුරුදු 15 වන විට ගැහැණු ළමයින්ගෙන් 90% ක්ම HPV එන්නත මගින් සම්පූර්ණයෙන්ම එන්නත් කරනු ලැබීම

- කාන්තාවන්ගෙන් 70%ක් වයස අවුරුදු 35 වන විටත්, නැවත වයස අවුරුදු 45 වන විටත් (* ගුණාත්මක භාවයෙන් ඉහළ පරීක්ෂණයක් මගින්) ගැබ්ගෙල පිළිකා සඳහා පරීක්ෂා කර තිබීම

- ගැබ්ගෙල රෝග හඳුනා ගත් කාන්තාවන්ගෙන් 90% ක්ම ප්‍රතිකාර ලබා ගෙන තිබීම




- ජාතික පිළිකා මර්දන වැඩසටහන මගින්, ශ්‍රී ලංකාවේ ගැබ්ගෙල පිළිකා තුරන් කිරීමේ අන්තර්කාලීන ඉලක්ක කරා ළඟාවීම සඳහා ජාතික උපායමාර්ගික සැලැස්ම, 2021-2030 ප්‍රකාශයට පත් කරන ලදී.

- මහජන සෞඛ්‍ය කාර්ය මණ්ඩලය ලෙස අප ශ්‍රී ලංකාවේ මෙම ඉලක්ක සපුරා ගැනීම සඳහා කණ්ඩායමක් ලෙස කටයුතු කළ යුතුය.

ජාතික පිළිකා මර්දන වැඩසටහන

සෞඛ්‍ය අමාත්‍යාංශය

No.555/5, මහජන සෞඛ්‍ය සංකීර්ණය,
ඇල්විටිගල මාවත, කොළඹ 05

0112368627

https://www.nccp.health.gov.lk

https://www.facebook.com/NCCPSL




ස්තුතියි